# කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

**01.** අධ්‍යක්ෂ ජනරාල් තනතුර

**1.1** සුදුසුකම්- ජ්‍යේෂ්ඨ කළමනාකරණ සේවා ගණය තනතුරක සිට විශ්‍රාම ලැබූවකු වීම

**02.** සුදුසුකම්

**2.1.**ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ඉංජිනේරු, භෞතික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමඟ.

ඉහත අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ තනතුරට අදාළ ව ඉහතින් සඳහන් විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

සහ

රජයේ , රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම

**03.** පොදු කොන්දේසි -

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතුය.
- පරිගණක දැනුම හා හැකියාව තිබිය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුත්ක විය යුතුය.

**04.** වයස -

අවුරුදු 67 ට අඩු විය යුතුය.

**05.** පත්වීමේ ස්වභාවය -

එක් වසරක කාලසීමාවකට කොන්ත්‍රත් පදනම මත බඳවා ගනු ලබන අතර තනතුරේ අවශ්‍යතාවය හා සතුටුදායක කාර්යය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරිම සලකා බලනු ලැබේ.

**06.** වැටුප -

රා.ප.චක්‍රලේඛ 03/2018 විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම පරිදි විශ්‍රාම යන අවස්ථාවේ දී හිමිකම් තිබූ මාසික වැටුපට සමාන මාසික දීමනාවක් හිමිවේ.

**07.** තෝරා ගැනීමේ ක්‍රමවේදය -

පත්වීම් බලධරයා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

තනතුරට අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා නොමැතිවීම, නියමිත දිනට ඉදිරිපත් නොකරන හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08.** අයදුම්පත් ඉදිරිපත් කිරීම.

ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් https://spda.lk වෙබ් අඩවියේ සඳහන් අයදුම්පත්‍රය සම්පූර්ණ කර **2025.06.05** දිනට පෙර සභාපති ,දකුණු පළාත් සංවර්ධන අධිකාරිය, බාලදක්ෂ මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. අයදුම්පත් ඉදිරිපත් කරන ලිපි කවරයේ වම් පස "අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන ) තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතුය.

සභාපති ,
දකුණු පළාත් සංවර්ධන අධිකාරිය